අමාත්‍යාංශ –චක්‍රලේඛ අංක: 95/7/(V1)

මගේ අංකය: 4/ගුරුජා1/3099
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
'ඉසුරුපාය'
බත්තරමුල්ල.
1996.01. 25

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියළු කොට්ඨාශ භාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත,

## ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාර ඩිප්ලෝමාධාරීන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කිරීම

පහත සඳහන් ඩිප්ලෝමා පාඨමාලා උපාධි මට්ටමේ පාඨමාලා ලෙස සලකා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි 111 වන කොටසේ උපාධිධාරී ගුරුවරුන් අන්තර්ග්‍රහණය කළයුතු ආකාරය දැක්වෙන උපදෙස් පරිදි එකී ඩිප්ලෝමාධාරීන් ද ගුරු සේවයට අන්තර්ග්‍රහණය කර 1995.01.01 සිට ඔවුන්ට හිමි හිඟ වැටුප් වෙතොත් ඒවාද සමග වැටුප් සකස් කළ යුතුය.

1. රජයේ නැටුම් හා සංගීත විද්‍යාලයේ සංගීත/නැටුම්/නාට්‍ය පිළිබඳ අවුරුදු 6 – 4 පාඨමාලා ඩිප්ලෝමාව
2. රාමනාදන් ශිල්පායතනයේ සංගීත/නැටුම්/නාට්‍ය පිළිබඳ අවුරුදු 6 –4 පාඨමාලා ඩිප්ලෝමාව
3. රජයේ ලලිතකලායතනයේ චිත්‍රකලාව පිළිබඳ අවුරුදු 6– 4 පාඨමාලා ඩිප්ලෝමාව
4. පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ බහු තාක්ෂණායතනයක සිව් අවුරුදු ඩිප්ලෝමාව
5. ශ්‍රී ලංකාවේ විවෘත විද්‍යාලයක හෝ ඊට අනුබද්ධ සෞන්දර්ය විද්‍යාලයේ අවුරුදු 5 හෝ විගාහම් ඩිප්ලෝමාව

මෙම ගුරුවරුනට අදාල ඩිප්ලෝමාවසහතිකය පදනම් කරගෙන ගුරු පත්වීම් ලබාදී ඇති දිනයේ සිට මෙම කාරණය සඳහා ඔවුන් උපාධි ගුරුවරුන් වශයෙන් සැලකිය යුතුය.

යෝජනායතන උපලේකම් (පාලන හා මුදල්)
අතිරේක ලේකම්
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන ලේකම් වෙනුවට.

/25.